**මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව**

**-----------------------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍යප්රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් **31** දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **මාන්තෙයි බටහිර** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වන උප වගන්තියට අනුව **මූල්‍ය ප්‍රකාශන** සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛයේ අදාළ නීති රීති අනුව ක්‍රියා කළ යුතු වේ. | ඉදිරියේදී කාර්යසාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙලිදරව් කළ යුතුය. | පිළිතුර ලබා දී නොමැත. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා විසින් භාවිතා කරන ඉඩම් 44 ක ඔප්පු සභාවට ලැබී නොතිබුණි. | ඉඩම් ඔප්පු සභාව විසින් ආරක්ෂා කර ඇති බව සහතික කිරීමට පියවර ගත යුතුය. | ඉඩම් අයිතිය පිළිබඳ ලියකියවිලි ලබා ගැනීමට පියවර ගනිමින් සිටී. |
| (ආ) | 2009 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන උපයෝගී කරගෙන මිලදී ගත් රු. 850,000 ක වාහනවල අයිතිය සභාවට මාරු කර නොතිබුණි. | වාහනවල අයිතිය සභාව වෙත පැවරීමට පියවර ගත යුතුය. | පිළිතුර ලබා දී නොමැත |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ නිලධාරීන් වෙනුවෙන් ගෙවන ලද රු.13,952 ක අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම අත්තිකාරම නිවැරදි කළ නොහැකි තත්වයක් පවතී. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 30/2016 දරන චක්‍රලේඛය | වසරකට වැඩි කාලයක් තිස්සේ සභාව සතු වාහන 17 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂණ සිදු කළ යුතුය. | ඉන්ධන දහනය පරීක්ෂණ සිදු කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය** --

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,084,574 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.2,063,607 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2018.12.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2017.12.31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| කුලී | 9,001,660 | 6,355,635 | 734,550 | 8,623,000 | 8,077,925 | 545,075 |
| බලපත්‍ර ගාස්තු | 541,500 | 839,230 | - | 597,250 | 710,640 | 113,390 |
| වෙනත් ආදායම් | 11,842,245 | 25,272,438 | 439,500 | 10,801,139 | 11,429,909 | 628,770 |
| එකතුව | 21,385,405 | 32,467,303 | 1,174,000 | 20,021,389 | 20,218,474 | 1,287,235 |

**2.2.2 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ කුලී ශේෂයන්ගේ එකතුව රු.156,431 ක මුදල අයකිරීමට ඵලදායී ලෙස කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුය. | හිඟ කුලී ශේෂ අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු උසාවි දඩ මුදල් ශේෂය රු.9,041,429 කි. | උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට රු.2,276,762 ක මුද්දර ගාස්තු අයකළ යුතුව තිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 වන දිනැති අංක පොදු/2018/61 දරන විගණන ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනයට වෙරළාශ්‍රිත සම්පත් ආරක්ෂා කළ යුතු අතර තිරසාර ලෙස දැනුවත් කිරීම් කටයුතු සහ සමුද්‍රීය සහ දූෂණය පාලනය කිරීමේ සැලසුම් කිසිවක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. | ඉදිරියේදී අදාළ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 64 ක් සහා තථ්‍ය කාර්ය මණ්ඩලය 58 ක් වී තිබුණු අතර පුරප්පාඩු 06 ක් පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුයි. | ඉදිරි කාලයේදී අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම්වල සුරක්ෂිතතාවය තහවුරු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පැවතින වාහන අටක් සඳහා වාහන නවතා තිබීම සඳහා වූ රථ වාහන අංගනයක් නොමැති වීම නිසා වාහන විවෘත ප්‍රදේශයක නවතා ඇති බැවින් ඒවා ආරක්ෂා කිරීමට සභාව විසින් පියවර ගෙන නොමැත. | වාහන ආරක්ෂා කිරිම සඳහා සභාව කටයුතු කළ යුතුයි. | ඉදිරි කාලයේදී වත්කම් ආරක්ෂා කිරීම සඳහා පියවර ගනු ලැබේ. |

**3.3.2 නඩත්තු සහ අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා නොකළ වාහන නවයක් අලුත්වැඩියා කිරීමට හෝ බැහැර කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වාහන අලුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගත යුතුය. | භාවිතයට නොගත් වාහන අලුත්වැඩියා කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගෙන් වාර්තාවක් ලබා ගැනීමට පපියවර ගෙන තිබුණි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සැපයුම් හා සේවා සභාව සඳහා අයවැයගත පිරිවැය රු. 3,925,500 ක් වූ අතර තථ්‍ය වියදම රු. 5,014,386 කි. | අයවැය ලේඛනය සකස් කිරීමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රම සලකා බලා සකස් කළ යුතුය. | පිළිතුර ලබා දී නොතිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා අළුත්වැඩියා කරන ලද ප්‍රග්ධන වත්කම්වල අයවැයගත වියදම රු. 4,702,500 ක් වන අතර තථ්‍ය වියදම රු. 5,967,599 කි. | අයවැය ලේඛනය සකස් කිරීමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රම සලකා බලා සකස් කළ යුතුය. | පිළිතුර ලබා දී නොතිබුණි. |